# කවි කොළය

## පොල්ගෙඩි සරුංගල් මෙන් දැන් උඩ යනවා....!

නොමැතිව පහසුකම් අන්තිම අවම ඉමේ
රෝගෙට ගොදුරු වී ගුරුවරු නොමැති කමේ
එකිනෙක වැසෙද්දී පාසැල් තිබෙන ගමේ
රජ විදුහල් හදයි ගම්වල ඇමති තෙමේ

නීතිය අතට ගත් ගැමුණුගෙ අව තාරේ
එළවළු විකිණීම කැළණියෙ මහ පාරේ
පනවා වෙනම රජයක බල අදි කාරේ
තහනම් කළා - රට යයි නන්නත් තාරේ

දකුණයි වමයි දෙක කාලෙට මැති වරණ
උනුනුන් අන කොටාගනු දුටුවෙමි පොරණ
පොරකා මනාපෙට ඇත්තොම රජ කරන
පත්වී තිබේ අද තැන තැන මිනි මරණ

අහසට නැගුණු හින්දා අල ගෙඩියෙ මිළ
හරියට බලා උගුලන කාලයම අල
ආනයනය කළෙන් උතුරයි වෙළඳ පොළ
පාරට බසිති ගොවියෝ ගෙන උදලු තල

තෝරුන් කිලෝ එක දාහට විකිණෙන වා
ඇති හැකි එකා ඒවා අරගෙන කන වා
එළවළු නොකා දැන් සති ගණනක් වෙන වා
පොල් ගෙඩි සරුංගල් මෙන් උඩ ඉගිලෙන වා

සමහර සබාපතිවරු යූ- සී- බාර
හැදුවත් කෝටි ගණනක් වැයකොට පාර
ගැමියෙකු අතින් ගලවා පැදුරම තාර
පෙන්වනු දුටිමි කොහොමද ටෙන්ඩර් පාර

කඩයෙන් මිරිස් පන්සීයක් ගෙන ඉල්වා
කරලෙන් කරල ගෙන බැලුවිට ඇස දල්වා
රුපියල් පහකි කරලක් - ටිල්වින් සිල්වා
කීවා. පරණ ලෝකඩ සීනුව සොල්වා

මේකලු වැඩිම රට ලෝකෙම විදුලි බිල
පටි තදකරන හැටි පවසති ඇමති රැළ
ගත හැකි කිසිත් නැත දී රුපියලක මිළ
නොගනිති හිඟන්නොත් දුන් විට දහයෙ කොළ

බත් හොදි මාළු ඒවා ඉස්සර කෑම
අපි නම් පාන්මයි කන්නේ හැම දාම
හැදුනත් ලෙඩක් බැහැ වාහනයන යෑම
දාහයි දෙදාහයි දොස්තරලගෙ ගේම

සිරසට ගල් ගහපු
පාතාලයෙ නරියෝ
ඇලවී බිත්තිවල
ඡන්දෙට කට ඇරියෝ
පොර ඇනගනිති කොළ පැහැ
තණ කන ගෙරියෝ
මහ රජතුමනි! ජීවත්වන්නට
බැරියෝ



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



# Breast milk ice cream goes on sale in Covent Garden cafe

A restaurant in London's Covent Garden is serving a new range of ice cream, made with breast milk.

The dessert, called **Baby Gaga**, is churned with donations from London mother **Victoria Hiley**, and served with a rusk and an optional shot of Calpol or Bonjela.

Mrs Hiley, 35, said if adults realised how tasty breast milk was more new mothers would be encouraged to breastfeed.

Each serving of Baby Gaga at Icecreamists costs £14.

Mrs Hiley's donation was expressed on site and pasteurised before being churned with Madagascan vanilla pods and lemon zest.

Icecreamists founder Matt O'Connor placed an advert appealing for breast milk donations and believes his new recipe will be a success.

" If it's good enough for our children, it's good enough for the rest of us," said Victoria Hiley the mother who gave the milk to the icecream parlour.

"Some people will hear about it and go yuck - but actually it's pure organic, free-range and totally natural."

Mrs Hiley, who gets £15 for every 10 ounces of milk she donates to the company, said it was a great " recession beater ". " What's the harm in using my assets for a bit of extra cash? " she added.

### This what happened two weeks later.
### Council officers remove Breast Milk Icecream

Ice cream made from breast milk has been removed from a central London restaurant on health grounds following complaints by members of the public.

The dessert, called Baby Gaga, went on sale at ice cream parlour Icecreamists in Covent Garden, London in February.

But Westminster Council officers removed the product to make sure it was "fit for human consumption".

## තනකිරි වලින් හැදූ අයිස් ක්‍රීම්

අයිස් ක්‍රීම් නිශ්පාදනය කරන්නට කිරි පාවිච්චිකරන බව අපි දනිමු. එහෙත් ප්‍රථම වතාවට ඒ සඳහා මිනිස් තනකිරි යොදා ගන්නා බව ලන්ඩනයෙන් අසන්නට ලැබේ. මධ්‍යම ලන්ඩනයේ කොවෙන්ට් ගාඩ්න් හි අවන් හලක තනකිරි යෙදූ අයිස් ක්‍රීම් විකුණන බව පුවත්පත්වල පළ විය. බීබීසී ප්‍රවෘත්ති මගින්ද එබව විකාශනය කළාය.

එම අවන්හලට තනකිරි සපයා ඇත්තේ කිරිබොන බිළිදෙකු ඇති මවක් වන වික්ටෝරියා හිලී නමැති 35 වියැති කාන්තාවය. ඇයගේ සෑම තන කිරි අවුන්ස 10 කටම ඇයට පවුම් 15 ක් ගෙවනු ලැබේ.

බේබි ගාගා යනුවෙන් නම්කර ඇති එම තනකිරි අයිස්ක්‍රීම් එකක මිළ පවුම් 14 කි.

මෙම අයිස් ක්‍රීම් ආයතනය හිමි මැට් ඕකොනර් නම් ස්කොට්ලන්ත ජාතිකයා වෙබ් අඩවියක තනකිරි අවශ්‍ය බවට පළකළ දැන්වීමකට ලැබුණු ප්‍රතිචාරය එක් කාන්තාවක් පමණි. එහෙත් ඉදිරියට තවත් අය ඉදිරියට ඒවි යැයි ඔහු සිතයි.

තනකිරි සැපයූ වික්ටෝරියා හිලී මෙසේ කියයි.

" මෙහෙම අයිස් ක්‍රීම් ජාතියක් කිව්වම ෂික් කියලා සමහරු මූණ ඇඹුල් කර ගනීවි. ඒත් මම නම් හිතන්නෙ තනකිරි හරි ස්වාභාවික පිරිසිදුව කිසිදු කළවමක් නැතිව තැනුණු පෝෂ්‍ය ගුණයෙන් පිරුණු දියරක් හැටියට. ඒ කිරි පොඩි දරුවන්ට හොඳ නම් එහෙනම් හැමෝටමත් හොඳයි."


" මට ස්වභාවයෙන් ලැබිලා තියන ශාරීරික වස්තුවකින් වැඩිපුර මුදලක් උපයගත්තම ඉතින් මොකද.....? " ඇය අසයි.

### ඒ අයිස් ක්‍රීම් තහනම්

තනකිරි අයිස් ක්‍රීම් අරඹා සතියකට පසු ලන්ඩනයේ වෙස් මිනිස්ටර් නගර සභාවේ නිලධාරීන් පැමිණ එම අයිස්ක්‍රීම් මිනිස් පරිභෝජනයට නුසුදුසුය කියා තහනම් කළ බවක් ගිය සතියේ දැන ගන්නට ලැබිණ.

## President's Cursing Parrot
## කුණුහරුප කියන ගිරවා

The US military, which now has a 138-page plan for State Funerals, had to depart from the old rule book when **President Andrew Jackson** died in 1845. His parrot **Pol** which could swear in English and Spanish was allowed in the funeral parlour to perch by his body - but was removed when mourners complained about his cursing!



ඇමරිකානු රජයේ රාජ්‍ය ප්‍රභූන්ගේ අව මඟුලකදී පිළිපැදිය යුතු චාරිත්‍ර හා නීතිරීති අඩංගු පිටු 138 ලියවිල්ලක් වෙයි. ඒ අනුව 1845 දී ඇමරිකාවේ 7 වන ජනාධිපතිවරයා වන ඇන්ඩෘ ජැක්සන් මියගිය අවස්ථාවේ ඔහු සුරතලට ඇති කළ පොල් නමැති ගිරවාට ජනපති මිනිය ළඟම ඉන්නට සලස්වන ලදී. ගිරවාට ඉංග්‍රීසි සහ ස්පාඤ්ඤ භාෂා කතා කළ හැකිව තිබූ බව කියති. මරණ ගෙදර එන අයට ගිරවා කුණුහරුප වචන කියා බැණවදින්නට වූයෙන් ලැබුණු පැමිණිලි නිසා වහා ගිරවා ගෙන ගොස් අවමඟුල අවසන් වන තුරු වෙනතැනක තබන්නට සිදුව ඇත.




**ඉරිදා** - ඊජිප්තුවෙ මුබාරක් ලොක්කා ගියා වගේ ගඩාෆිත්
**SUN** යාවි කියලා ඇමරිකාව සහ බටහිර රටවල් හිතනවා. ඒත් ගඩාෆි යන පාටක් නැහැ. " මම කොහේ යන්නද? මේක මගේ රට. මං මැරෙන්නෙත් මෙහේ. " ගඩාෆි කියනවා. ඔබාමා කියලා තිබුණා, ගඩාෆිට වෙනරටකට යන්න කියලා. හොඳයි ගඩාෆි අන්තිම නරක මිනිහෙක් කියලා කියමු. ඔබාමාට තියන අයිතිය මොකක්ද මිනිහෙකුට ඒ මිනිහගෙ රටෙන් යන්න කියන්න? ලිබියාවෙ අය ගඩාෆි ගැන බලාගනීවි. එක්කො අල්ලලා ඉඹීවි, හොඳ නැත්නම් එළවාවි, නැත්තං ඔක්කොම එකතුවෙලා ගහලා මරාවි. ඒක ලිබියාවෙ මිනිස්සුන්ගෙ වැඩක්. ඔබාමා මොකටද හොට දාන්නෙ? ඔබාමටත් හරිනම් ඇමරිකාව අයිති නැහැ. එයා කීනියාවෙ මිනිහෙක්.

**සඳුදා** - ඇමති මර්වින් සිල්වා කැළණිය පළාතට වෙනම
**MON** නීති රීති මාලාවක් ගෙනැල්ලා. වට්ටක්කා, වම්බොටු, අළුකෙහෙල්, පතෝල කියන එළවළු ජාති කැළණියෙ කිසි තැනක විකුණන්න තහනම්. මර්වින් කියන්නෙ ඒව තමන්ම වවාගන්න කියලා. ඒව කන්න ඕන අය පිටින් ගෙනාවට කමක් නැහැයි කියනවා. ඒ පැත්තෙ කිසිම තැනක නිල් පාට ඇරෙන්න වෙන කොඩියක් දාන්න බැහැ. මොකද කැළණිය විෂ්ණු දෙවියන්ගෙ අඩවියලු. කොළ රතු කොඩි කොහොමටවත් බැහැ. ඒ කිව්වෙ යූ ඇන් පී, ජේවීපී ගැන හිතලා. කවුද මර්වින්ගෙන් අහලා තිබුණා කැළණියෙ කොයින්ද විෂ්ණුදෙවියො කැළණියෙ ඉන්නෙ විභීෂණ නේ කියලා. මර්වින් ඒකට කටපියා ගත්තා. මෙහෙමත් ඇමතිවරු අපි ලෝකෙ කිසිම රටක ඉන්න බවක් අහලා නැහැ. .

**කුජදා** - මේ දවස්වල ක්‍රිකට් වර්ල්ඩ් කප් එකට තරඟ
**TUE** කරනවා. ලංකාවත් සත්කාර රටක්. මේ අතරෙ එන ආරංචියක් තමයි ලංකාවෙ සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය ලෝකෙ ලොකුම ක්‍රිකට් බෝලය හදලයි කියලා. ඒක ගිනස් පොතටත් යනවලු. ඊළඟට හදාවි උස පොල් ගහක් කපලා අරගෙන ලෝකෙන් ලොකුම ක්‍රිකට් පිත්ත. මේවයින් සෙල්ලම්කරන්න මිනිස්සු කොහෙන්ද හොයන්නෙ? ඉවුම් පිහුම්වලට නම අරන් ඉන්න අපේ ලොකුම සූපවේදියා පබිලිස් උන්නැහෙ යාර 25 ක් දිග ලෝකෙ ලොකුම කිරිබත හැදුවා. ඇයි ඒක ඉතියෝපියාවට ගිහිං හැදුවෙ නැත්තෙ එහේ මිනිස්සුන්ට කන්න. මේ කරන්න දේවල් නැතුවටද? අපේ ආත්තම්ම කියනව වගේ ලෝකෙ තියන සේරම විගඩං ලංකාවෙන් ඉවරයි.

**බුදදා** - මේ පුෂ්පා පෙරේදා ටෙලිපෝන් කරපු වෙලාවෙ
**WED** කිව්ව දෙයක්. පුෂ්පයි ඇන්ඩෘයි ඉන්නෙ වික්ටෝරියා වල උස බිල්ඩිමක තියන ප්ලැට් එකක. එදා රෑ පුෂ්පා ලංකාවෙ කඩේකින් ගෙනා හාල් මැස්සො වගයක් බදින්න ගිහිං තියනවා. හාල් මැස්සො ටික තෙලට දැම්ම ගමන් ඒ කුස්සියෙ සීලිමේ හයිකරලා තියන දුම පාලනයකරන ස්මෝක් එලාම් එකේ නලාව සද්දවෙන්න වෙන්න පටන්අරගෙන. මේක නවතින්නෙ නැතිලු. කොහු මිටෙන් ඒකට ඇන්නත් සද්දෙ නැවතිලා නැහැ. විනාඩි පහක් යන කොට කවුද දොරට කුළු ගෙඩියකින් ගහලා දොරත් කඩාගෙන ඇතුල්වෙලා. ඒ ලන්ඩන් ගිනි නිවන හමුදාවෙ කට්ටිය විස්සක් විතර. පුෂ්ප එතකොටයි දන්නෙ ඒ එලාම් එක පොලීසියටයි ෆයර්බ්‍රිගේඩ් එකටයි සම්බන්ධ බව. පුෂ්පා බයවෙලා. ප්‍රශ්නයක් වෙලා නැහැ හැබැයි පුෂ්පට අවවාදකරලා තියනවා. හාල්මැස්සෙක් නිසා මීට පස්සෙ අපේ කාලය කන්න එපා කියලා.

**ගුරුදා** - හුඟ කාලෙකින් තලවකැලේ නැන්දම්මා ගැන
**THU** තොරතුරක් ලැබුණෙ නැහැ. අනේ ඉස්සර මාසෙට ලියුම් දෙක තුනක් එව්වා. යුද්දෙ තියන දවස්වල නැන්දම්මාගෙන් තමයි අපි ලංකාවෙ විස්තර දැනගත්තෙ. ඇඹිලිපිටියෙ දුවලයි ගෙදර ගිහිං ඇතිය කියලා මට හිතෙනවා. නැන්දම්ම අසනීපෙන්ද දන්නෙ නැහැ. පිට රටක ඉන්න එකේ ලොකු අවාසිය තමයි නෑයෙකුගෙ හරි හිතවතෙකුගෙ හරි විස්තරයක් දැනගන්න බැරිවීම.

**කිවිදා** - ඊයෙ බෙල්සයිස් පාක්වල ෂෙඩ් එකෙන් පැට්‍රල්
**FRI** ගහන්න ගියාමයි දැක්කෙ එතන ලීටර් එකක් £1.35 ක්. මේ මාස කීපයට පැන්ස හැට ගාණක් වැඩිවුණා. දැන් මැද පෙරදිග කලබල වලට තව පැට්‍රල් ගණන් යාවි. මාස තුනකට ඉස්සෙල්ලා යුනිවර්සිටි ශිෂ්‍යයින් ගාස්තු වැඩිකිරීමට විරුද්ධව දැවැන්ත උද්ඝෝෂණයක් කළා. ගිය සතියෙ අතුරු මැතිවරණයෙන් කැමරන් රජයෙ නියෝජිතයට අන්ත පරාජයක්. මේ එන විදියට නම් එංගලන්තෙටත් කමින් කලර් නෝ ගුඩ් වගෙයි.

**ශනිදා** - පකිස්ථානෙ ඇමරිකානු ඇම්බසියෙ ඇමරිකන්
**SAT** නිලධාරියෙක් පකිස්ථාන් මිනිස්සු දෙන්නෙකුට වෙඩි තියලා මරලා. ඒ වරදට නිලධාරියා අත්අඩංගුවට අරං රිමාන්ඩ් බාරයෙ තියලා නඩුව අහන්න ලෑස්තිවෙනවා. ඇමරිකාව පකිස්ථාන් රජයට කියනවා වහාම අපේ නිලධාරියව එළියට දාපල්ලා නැත්නම් උඹලට ඇමරිකාවෙන් දෙන ආධාර නවත්වනවා කියලා. ඒ කියන්නෙ ඇමරිකාවට ඇහැකි ඕන රටක ගිහිං මිනිස්සු මරන්න. ඒ රටවල් කරබාගෙන ඉන්න ඕන. පුදුම වැඩක් !